

# මට කිසිදෙයක් හැරයන්න බෑ

## ධර්මසිරි බණ්ඩාරනායක

*කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම ප්‍රදේශයේ මධ්‍යම පාන්තික ග්‍රාමීය පවුලක දෙවැනි පිරිමි දරුවා ලෙස ධර්මසිරි බණ්ඩාරනායක 1949 ඔක්තෝබර් 06 වෙනි දින මෙලොව එළිය දුටුවේය. ඔහුගේ පියා ඔරලෝසු කාර්මික ශිල්පියෙකු වූයෙන් කුඩා අවධියේ සිටම ධර්මසිරිටත් ඔහුගේ සොයුරන් දෙදෙනාටත් ඒ පිළිබඳ හුරුවක් ඇතිවූ අතර සිය සොයුරන් පියාගේ අඩි පාරේ යමින් අනාගතය සරුකර ගනිද්දී ධර්මසිරිගේ දිවි මග වැටී තිබුණේ වෙනත් ඉසව්වක් ඔස්සේය. හොරණ විද්‍යාරතන විද්‍යාලයේ කලා අංශයෙන් උසස් පෙළ හදාරමින් සිටියදී නාට්‍ය විෂයෙහි ඇතිවන විශේෂ ඇල්මේ ප්‍රතිඵලයක් ලෙස එවක කොළඹ සුදර්ශීහි පැවති නාට්‍ය පුහුණු වැඩමුළු මාලාවක් සඳහා සහභාගිවන ධර්මසිරි එහි ප්‍රතිඵලයක් ලෙස සිනමා නළුවෙකු බවට පත්වන්නේ පාසල් ශිෂ්‍යයෙකුව සිටියදීමය. ඒ දයානන්ද ගුණවර්ධනයන් විසින් 1969 නිර්මාණය කළ 'බක්මහ දිගය' චිත්‍රපටයේ චරිතයක් නිරූපනය සඳහා ඔහුව තෝරාගැනීමෙනි. අනතුරුව හෙන්රි ජයසේනගේ 'මකරා' නාට්‍යයේ ප්‍රධාන චරිතය සඳහාද ඔහුව තෝරාගැනෙන අතර එලෙස ඇරඹෙන ධර්මසිරිගේ කලා දිවිය මේ වන විට දශක හතරක් සම්පූර්ණ කර තිබේ. වීර පුරන් අප්පු (1978), සරුංගලේ සහ පළගැටියෝ(1979), හංස විලක් (1980), බඹා කෙටූ හැටි (1981), බොරදිය පොකුණ (2004) යන චිත්‍රපටවල නළුවෙකු වෙමින්ද, හංස විලක් (1980), තුන්වෙනි යාමය (1983), සුද්දිලාගේ කතාව (1985), බව දුක සහ බව කර්ම (1997), චිත්‍රපටිවල අධ්‍යක්ෂවරයා වෙමින්ද, වීර පුරන්අප්පු (1978) සහ තුන්වෙනි යාමය චිත්‍රපටිවල නිෂ්පාදකයා වෙමින්ද, හංස විලක් සහ තුන්වෙනි යාමය චිත්‍රපටිවල තිර රචකයා වෙමින්ද ගෙවුණු දශක හතරක කාලය තුළ සිනමාවට නොමැකෙන මතක සටහන් එක්ක-රන්නට ධර්මසිරි සමත්විය. 1981 (හංස විලක්), 1984 (තුන්වෙනි යාමය) සහ 1997 (බව දුක) වසරවල හොඳම තිර රචනය වෙනුවෙන් පිදෙන සරසවි සම්මානයෙන් සහ ජනාධිපති සම්මානයෙන්ද, 1986 (හංස විලක් ) සහ 1997 (බව දුක) හොඳම අධ්‍යක්ෂවරයා ලෙස සරසවි සහ ජනාධිපති සිනමා සම්මා-නයෙන්ද සම්මානයට පාත්‍ර වූ හෙතෙම කොළඹ විශ්ව විද්‍යාලය මගින් පිරිනමන 'ප්‍රසාද ප්‍රණාම' සම්මානය (1996) ඇතුළුව දෙස් විදෙස් ඇගැයීම් ගණනාවකටද පාත්‍රවී සිටී.*
*ඒකා අධිපති (1972), මකරාක්ෂයා (1985), ධවල භීෂණ (1989), යක්ෂාගමනය (1994), ට්‍රොජන් කාන්තාවෝ (1999) යන නාට්‍ය නිර්මාණය කරමින් වේදිකාවේද සුවිශේෂ දස්කම් දක්වා ඇති ඇති ධර්මසිරි බණ්ඩාරනායකයන් සමග කෙරුණු ප්‍රත්‍යාවලෝකන සංවාද සටහනයි මේ.*

**නාට්‍යකරුවෙකු සහ සිනමාකරුවෙකු විදිහට ඔබ ක්ෂේත්‍රයට පිවිසෙන්නේ කවරාකාරයෙන්ද කියන තැනින් අපි කතා බහ ආරම්භ  කළොත් ?**

මම උසස් පෙළ කරන කාලේ ඉඳලම නාට්‍ය කලාවට යොමුවෙලා හිටියේ. පාසල් නාට්‍ය කළා. ඒ අතරේ ඔය කාලේ සුදර්ශීයේ තිබුණා නාට්‍ය සහ රංග කලාව ගැන පුහුණු වැඩමුළු මාලාවක්. මාසෙකට රුපියල් සීයක් ගෙවන්න ඕනේ. මම ඉස්කෝලේ යන අතරෙම කොළඹ ගිහිල්ලා මේ වැඩමුළුවලට සහභාගී වුණා. එතනදි ඒ කාලේ ක්ෂේත්‍රයේ හිටිය ප්‍රධානම පුද්ගලයන් හඳුනාගන්නත් ඒ අයගෙන් මග පෙන්වීම් ලබාගන්නත් අවස්ථාවක් මට ලැබුණා. ඒක සුවිශේෂි වුණා මගේ ගමනට. එක අවස්ථාවක දයා-නන්ද ගුණවර්ධන හදන චිත්‍රපටියක චරිතයක් සඳහා මාවත්, යූ. ආරියවිමල්වත් දෙන්නගෙන් කෙනෙක් ගන්න තීරණය කරලා අපි දෙන්නව සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් කෙරුණා. එතනදි ඇත්තෙන්ම බැලුවේ කැමරාවට වඩා සුදුසු මුහුණ කාගෙද කියන එක. පරීක්ෂණය කරපු කැමරා ශිල්පියා දැක්ක ගමන්ම මාව පෙන්නලා 'හී හිස් ද මෑන්' කියලා කිව්වා. මාව බක් මහ දීගය චිත්‍රපටියට තෝරාගත්තේ ඒ විදිහට. ඉස්කෝලේ යන කාලෙම චිත්‍රපටියක රගපාන්න ලැබීමෙන් මම සිනමා නළුවෙකු බවට පත්වුණේ එහෙමයි. ඒ වෙනකොට පාසල් නාට්‍යවලටත් සම්බන්ධවෙලා හිටියත් ප්‍රසිද්ධ වේදිකාවේ මුලින්ම ප්‍රධාන චරිතයක් නිරූපනය කරන්නට ලැබුණේ හෙන්රි ජයසේනගේ මකරා නාට්‍යයේ.

**පාසල් ශිෂ්‍යයෙක් චිත්‍රපටි නළුවෙක් වීමෙන් මො-නවගේ තත්ත්වයන්ටද මූණ දෙන්න සිද්ධ වුණේ ?**

හොඳ පිළිගැනීමක් ලැබුණා. මට රස්සාවක් ලැබෙන්නත් විශේෂ සුදුසුකමක් බවට ඒක පත්වුණා. 71 කැරැල්ල ඇතිවෙන්නෙ ඔය කාලේ. මමත් ශිෂ්‍යයෙක් විදිහට ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වුණා. මට විශ්ව විද්‍යාලේ යන්න බැරිවුණා. විශ්ව විද්‍යාල රැඳවුම් කඳවුරු බවට පත්වෙලා ඒවා නැවත විශ්ව විද්‍යාල වෙන්නේ කවදාද කියලා අවිනිශ්චිත කාලයක උසස් පෙළ විභාගයෙන් පස්සේ මම රස්සාවක් කරන්න තීරණය කළා. රබර් පාලන දෙපාර්ථමේන්තුවේ ලිපිකරු රැකියාවකට ඉල්ලුම් පත්‍රයක් දාලා සම්මුඛ පරීක්ෂණයට ලිපියක් ආවා. ඒකට ගියාම දැක්ක ගමන් මාව අඳුනගත්ත පරීක්ෂක මණ්ඩලේ අය චිත්‍රපටිය ගැන කතාකරන්න පටන් ගත්තා මිස සම්මුඛ පරීක්ෂණයක් කළේ නෑ. හිනා වෙවී කතාකර කර ඉඳලා ගෙදර ආව. මට රස්සාව ලැබුණා. ඒ රස්සාව කරන අතරේ තමයි මම මුල් කාලේ නාට්‍ය කළේත් චිත්‍රපටි කළේත්.

**ඔබගේ සහෝදරයන් ගිය මග තෝරා නොගන්න විශේෂ හේතුවක් තිබුණද ?**

තාත්තා මටත් ඔරලෝසු කාර්මින වැඩ පුරුදු කළා. මම කාලයක් තාත්තා යටතේම ඔරලෝසු කාර්මිකයෙක් විදිහට රස්සාවත් කළා. මම හිතන්නේ මට හිමි තැන වුණේ එතැන නෙවෙයි කියලයි. මටත් නොදැනිම වුණත් මම හිමි තැනට එන්න ඇති. අදටත් මගේ සහෝදරයෝ තාත්තාගේ කර්මාන්තය දියුණු කරගෙන හොඳට ඉන්නවා.

**71 කැරැල්ලෙදි ඔබට සිනමාවෙන් සහ වේදිකාවෙන් පිටස්තරව හිමිවෙලා තිබුණ භූමිකාව මොන වගේ එකක්ද ?**

මම ශිෂ්‍යයෙක් විදිහට  ජනතා විමුක්ති පෙරමුණට එකතුවුණාට කැරැල්ලට සම්බන්ධ වුණේ නෑ. පන්ති පහෙන් තුනකට සහභාගී වුණ මම ජනතා විමුක්ති පෙරමුණෙන් අයින් වුණා. ඔවුන්ගේ වැඩපිළිවෙළ තුළ

සංවාදය
ශ්‍රීලාල් සෙනෙවිරත්න

මට කොහොමටවත් එකගවෙන්ඩ බැරි දේවල් තිබුණා. තමන්ගේ මතයට විරුද්ධ මත දරන්නන් විනාශ කළ යුතු සතුරන් විදිහට සළකන එක ඒ අතරින් ප්‍රධාන එකක්. ඔවුන් සමාජයට අමතන ප්‍රවේශය රළු චණ්ඩ එකක්. ඔවුන් සමාජය සමග ගණුදෙනු කරන විදිහට නෙවෙයි මට සමාජය එක්ක ගනුදෙනු කරන්න වුවමනාව තිබුණේ. ඒකයි මම කලිනුත් කිව්වේ මම මට හිමි මාවතට වැටුන කෙනෙක් කියලා.

**ඔබගේ ප්‍රථම සිනමා නිර්මාණය 'හංස විලක්'. එහි ඔබ දකින සුවිශේෂීතාවය ගැන කතා කළොත් ?**

මම හංස විලක් චිත්‍රපටියේ පිටපත ලියලා චිත්‍රපටි සංස්ථාවට ඉදිරිපත් කළාම ඒක තේරුණේ තුන්වෙනි ශ්‍රේණියේ තිර රචනා වර්ගයට. ඒ එක්කම චිත්‍රපටියක් හදන්න සංස්ථාවෙන් ණය දෙන්න නම් පළවෙනි ශ්‍රේණියේ තිර රචනාවක් තියෙන්න ඔනේ, අධ්‍යක්ෂවරයා ඊට ප්‍රථමයෙන් චිත්‍රපට දෙකක සහාය අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරලා තියෙන්න ඕනේ කියලා සුදුසුකම් ගණනාවක් නියම කරලා තිබුණා. ඒ එක සුදුසුකමක්වත් මට තිබුණේ නෑ. ඒ නිසා සංස්ථාවෙන් ණය මුදලක් ලබාගන්න බැරිවුණා. ඒ වෙලාවේ චිත්‍රපටිය නිෂ්පාදනයට ඇල්බට් ජයසිංහ කියලා මහත්මයෙක් කැමැත්ත පළකළා. චිත්‍රපටිය සඳහා ගිය වියදම දෙලක්ෂ හතලිස් හතරදාහ ඒ මහත්මයා මට ලබාදුන්නා. එදා එහෙම නොවෙන්න හංස විලක් චිත්‍රපටිය හැදෙන්නේ නෑ. චිත්‍රපටි හැදීම සඳහා රටේ තියන ආයතනය මට සල්ලි දුන්නේ නෑ. නියෝග විතරයි දුන්නේ. ඇල්බට් මහත්තයා දුන්න සල්ලි වලින් චිත්‍රපටි සංස්ථාවේ නියෝග අනුව මම හංස විලක් හදලා සංස්ථාවේ සම්භාව්‍ය පස්වෙනි මණ්ඩලයට ප්‍රදර්ශණය සඳහා ඉදිරිපත් කළාම ඒ අය ඒක තෝරාගත්තා. සංස්ථාවට අනුව තුන්වෙනි ශ්‍රේණියේ තිර රචනයකින් සංස්ථාවේ නීති රීති වලට අනුවම සම්භාව්‍ය චිත්‍රපටියක් බිහිවුණේ ඔන්න ඔය විදිහටයි. ඒකෙන් චිත්‍රපටි සංස්ථාවේ ආකල්ප නීති රීති වගේ දේවල් පොඩි පට්ටම් වෙලා ගියා. එනකෙනෙකුට එන්න ඉඩ දෙන තැනකට චිත්‍රපට සංස්ථාවට සීරු මාරුවෙන්න සිදුවුණේ හංස විලක් චිත්‍රපටියෙන් පසුවයි. ඒ නිසා සිංහල සිනමා ඉතිහාසයේ නොමැකෙන චිත්‍රපටියක් විදිහට හංස විලක් සලකන්න පුළුවන්. මම දකින සුවිශේෂීතාවය එයයි.

**රජයේ ආයතනය ලිපිකරුවෙක් විදිහට රස්සාව කරන අතරේ මේ විදිහට කලා කටයුතුවල යෙදෙන්න ඉඩ හදාගත්තේ කොහොමද ?**

බොහෝම අමාරුවෙන් තමයි කරගෙන ගියේ. රස්සාවක් නැතුව බැරි නිසා අල්ලගෙන හිටියට එතන හිටපු නිලධාරිනුත් නිතරම කිව්වේ මේ දෙකම එකට කරන්න බෑ. දෙකෙන් එකක් තෝරාගන්න කියන කතාව. අන්තිමේ මට දෙසැරයක්ම රජයේ රස්සාවෙන් අයින්වෙන්න සිද්ධ වුණා. 79 මැන් හයින් චිත්‍රපට උළෙලට මට සහභාගි වෙන්න අවස්ථාව ලැබෙනවා. ප්‍රථම චිත්‍රපට තැනූ අධ්‍යක්ෂවරුන්ගේ සම්මාන උළෙල. ඒ වෙනකොට මම රබර් පාලන දෙපාර්ථමේන්තුවේ සේවය කරමින් සිටියේ. එතනින් මට මේ ගමනට මාසයක් නිවාඩු අනුමත කරන්න බෑ කියලා කිව්වා. ඒ වෙලාවේ මම රස්සාවෙන් අයින්වෙලා මේ භාග්‍යමත් අවස්ථාවට සහභාගි වෙන්න තීරණය කරලා ඉල්ලා අස්වීම දීලා ජර්මණියට ගියා. ගිහිල්ලා ආවට පස්සේ මට මුණගැහුණා ගාමිණී දිසා-නායක ඇමැතිතුමා. ඔහු හංස විලක් බලලා ඉතාම ඉහළින් ඒ චිත්‍රපටිය වර්ණනා කරපු ඇමැතිවරයෙක්. මා හමුවුණ වෙලාවෙ ඔහු ඇහුවා කොහෙද රස්සාව කරන්නේ කියලා. මම කිව්වා රස්සාවට සිද්ධවුණ දේ. ඊට පස්සේ ඔයා එන්න මගේ මිනිස්ට්‍රියට කියලා මාව මහවැලි අමාත්‍යාංශය යටතේ තියන පහත් බිම් සංවර්ධන මණ්ඩලයේ ඉහල තනතුරකට ගත්තා. එතන මම වැඩකරන අතරේ මම තුන්වෙනි යාමය තිර රචනය ලියලා සංස්ථාවේ සීයට සීයේ ණය සහනාධාරයට ඉල්ලුම් කළා. ඒක අනුමත වුණා. එතනදි මට ආයෙත් රස්සාවෙන් අයින්වෙන්න සිද්ධවුණා චිත්‍රපටිය කරන්න.

**මේ කාරණා ගෘහ ජීවිතයට මොන විදිහටද බලපෑවේ ?**

මම කසාද බැන්දේ ඉතාම අඩු වයසෙන්. අවුරුදු විසි එකයි බදිනකොට. පාසල් කලේ ඉඳලා තිබිච්ච ප්‍රේම සම්බන්ධයක ප්‍රතිඵලයක් විදිහට තමයි විවාහය සිදුවුණේ. එයා මට වැඩිය ඉහළ පන්තියක ඉගෙන ගත්ත ගෑනු ළමයෙක්. බදින-කොට තාත්තා මට කිව්වා පුතේ තාම උඹට බදින්න වයසක් නෙවෙයි කියලා. ඒත් තාත්තා විරුද්ධ වුණොත් නෑ. තාත්තා අපි කරන දේවල්වලට බාධා කළ කෙනෙක් නෙවෙයි. සන්තෝෂෙන් ඒවට පුළුවන් විදිහට උදව් කළ කෙනෙක්. බැඳලා අපි පදිංචි වුණේ අපේ මහගෙදරමයි. ටික කාලයක් යනකොට තමයි මට තාත්තා කියපු දේවල් තේරෙන්න ගත්තේ. විවාහය කියන්නේ අපි හිතාගන ඉන්න තරම් සුන්දර දෙයක් නෙවෙයි කියලා මට දැනෙන්න පටන් ගත්තා. නැන්දා ලේලි ගැටුම් වලිනුත් අඩුවක් තිබුණේ නෑ. ඔය විදිහට කාලය ගතවෙද්දි අපිට දරුවන් දෙන්නෙකුත් ලැබුණා. නමුත් පවුල අවුල් සහගත තත්ත්වයකට පත්වුණා. ඒ අතරේ තමයි ස්වර්ණගෙයි මගෙයි අතරේ සම්බන්ධයක් ඇතිවෙන්නේ. සුද්දිලාගේ කතාව කරන කොටයි ඒක ඇතිවුණේ. මේ සම්බන්ධය නිසා මට තවත් දරුවෙක් ඇතිවුණා. ඉන් පස්සේ මම විවාහ ජීවිතය තුළින් දරුවෝ දෙන්නෙක්ගේ පියෙක් සහ පසුව ඇතිවුණ සම්බන්ධතාවයේ ප්‍රතිඵලයක් වශයෙන් තවත් දරුවෙකුගේ පියෙක් බවට පත්වුණා. වෙනත්